**ජාතික මෝස්තර මධ්‍යස්ථානය - 2023**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ("මධ්‍යස්ථානය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විනය පරීක්ෂණ නියෝගයක් මත 2021 වර්ෂයේදී සේවයෙන් පහකරන ලද නිලධාරියකුගේ රු.168,485 ක ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | කම්කරු විනිශ්චය සභාවේ පැමිණිල්ලක් සිදු කෙරෙන බැවින් මෙම හිග ශේෂයන් මේ දක්වා ගෙවා නොමැති බව . | ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනතේ 82(එ) වගන්තිය | රසායනාගාර,වැඩපොළ වල් සහ වෙනත් ආයතන පවත්වාගෙන යාම සඳහා ඉඩ දී තිබුණ ද වෙනම අධ්‍යයන ආයතනයක් ලෙස පිරිනිර්මාණ අධ්‍යයන ආයතනය ලියාපදිංචි කර නොතිබු අතර එහි අධ්‍යාපන අංශය මගින් පාඨමාලා පවත්වා ලාභ ඉපයීම සිදුකර තිබුණි. | අධ්‍යයන ආයතනය වෙනම ආයතනයක් ලෙස ලියාපදිංචි කර නොතිබු අතර මේ සඳහා මූලික සාකච්ඡා පවත්වා අනුකමිටුවක් පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | පනත ප්‍රකාරව අධ්‍යයන ආයතනය ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතෙහි 6.6 | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2024 | කාර්ය මණ්ඩල ඌණතාවය සහ භාණ්ඩ සමීක්ෂණය නිම කිරීමට කල්ගතවීම ප්‍රමාදයට බලපෑ අතර ඉදිරි වර්ෂවලදී මෙම අඩුපාඩුව මගහරවා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ඡේදය | මැයි 10 දින ඉදිරිපත් කර තිබුණි. | | |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (IV) වගන්තිය හා 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (අ) වගන්තිය | 2022 හා 2023 වර්ෂ වලදී ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව නිලධාරීන් 13 දෙනෙකුට එකතුව රු.1,081,245 ක අතිකාල හා නිවාඩු දින දීමනා ගෙවා තිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රයක් නොතිබු බැවින් පැමිණීම, පිටවීම සටහන් තබා නොමැත. වර්තමානයේ අධ්‍යාපන අංශයේ කටයුතු සඳහා කාර්ය මණ්ඩලයේ නිලධාරීන් පැමිණීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පැමිණීම, පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,739,450 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,751,598 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,987,852 ක පිරිහීමක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාර ප්‍රදාන රු. 20,513,444 කින් වැඩි වී තිබුණද සංවර්ධන වියදම් රු.16,787,126 කින් හා ක්ෂය ප්‍රතිපාදන රු.6,214,788 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලයේ CCTV කැමරා පද්ධතිය 2022 ජනවාරි මාසයේ දී අක්‍රීය වී තිබුණද විගණිත දින වූ 2024 ජුනි 02 දක්වාම නැවත යථා තත්වයට පත්කර නොතිබුණු අතර සැපයුම්කරුට ගෙවිය යුතු මුදල රඳවාගැනීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වගකීම් යටතේ රු.1,886,005 ක් ඉදිරියට ගෙන එමින් පැවතුණි. | පෙන්ත්හවුස් ආයතනය හා උප කොන්ත්‍රාත්කරු අතර පැවති ගැටළුවක් හේතුවෙන් අලුත්වැඩියාවන් සිදුනොකළ බැවින් රඳවාගැනීමේ මුදලින් බාහිර ආයතනයක් හරහා CCTV පද්ධතියෙහි අලුත්වැඩියා කටයුතු සිදුකර ගැනීමට පිරිවිතරයන් සකසා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | කැමරා පද්ධතිය කඩිනමින් ක්‍රියාත්මක තත්වයට පත් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නව නිර්මාණ සහ නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ ශිල්පීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක පුහුණුවක් රටපුරා ව්‍යාප්ත කිරීමේ අරමුණින් වැඩසටහන් 29 ක් පැවැත්වීමට රු.මිලියන 8.5 | ප්‍රාග්ධන ප්‍රතිපාදන මත හා මෝස්තර අංශයේ මෝස්තර සංවර්ධන නිලධාරීන්ගේ ඌනතාවය හේතුවෙන් ඉටු කිරීමට නොහැකි විය. එමෙන්ම | සියළු ප්‍රායෝගික තත්වයන් සලකා බලා සැළසුම් සිදුකළ යුතු අතර සිදුකළ සැළසුම් වලට අනුව |

| | | |
|---|---|---|
| ක් වෙන්කර තිබුණ ද පුහුණු වැඩසටහන් 17 ක් පමණක් පවත්වා තිබුණි. මේ යටතේ වැඩසටහන් හරහා ශිල්පීන්ට නව නිර්මාණ 450 ක් හඳුන්වාදීමට සැලසුම්කර තිබුණ ද නව නිර්මාණ 216 ක් පමණක් හඳුන්වා දී තිබු අතර නිර්මාණ 234 ක් හඳුන්වාදීමට නොහැකි වී තිබුණි. | වැඩසටහන් 07 ක් "UNDP" අරමුදල භාවිතා කර ඉටුකිරීමට සැලසුම් කර තිබුණද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය නොලැබීම හේතුවෙන් පුහුණු වැඩසටහන් තුළ නව නිර්මාණ 216 ක් පමණක් හඳුන්වාදීමට සිදු වු බව. | කාර්යයන් ඉටුකළ යුතුය. |

**3.3 අනාර්ථික ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය තුල ජොෂ්ඨ මෝස්තර ශිල්පීන් 05 දෙනෙකු හා සහකාර මෝස්තර ශිල්පීන් දෙදෙනෙකු සිටිය දී බාහිර මෝස්තර නිර්මාණ ආයතනයක් යොදා ගෙන එක් බතික් ගවුමක් රු.44,500 ක් බැගින් ගවුම් 16 ක් නිර්මාණය කිරීම සඳහා රු.712,000 ක් වැය කර තිබුණි. | ජාතික මට්ටමේ මෝස්තර නිර්මාණ දැක්මක් සඳහා ඇඳුම් නිර්මාණය කිරීමේදී ඒ සඳහාම විශේෂ වූ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහිත වූවකුගේ සේවය අත්‍යාවශ්‍ය බැවින් බාහිර මෝස්තර සම්පාදකයෙකුගේ සහාය ලබාගන්නා ලද බව. | ආයතනයේ පවතින සම්පත් වලින් ප්‍රයෝජන ගෙන ඵලදායීව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බතික් නිෂ්පාදන කර්මාන්තයේ නියුතු ශිල්පීන්ට පොදු පහසුකම් සැලසීම අරමුණු කරගනිමින් රු.2,991,720 ක් වැයකර පිරිපහදු පද්ධතියක් 2021 දෙසැම්බර් 16 දින ස්ථාපිත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදීද එමගින් අපේක්ෂිත අරමුණු ඉටු කරගෙන නොතිබු අතර යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. | බතික් කර්මාන්තයේ මෑත කාලීන පිබිදීමත් සමඟ නව ව්‍යාපාර ආරම්භ කිරීමට අපේක්ෂා කළ ප්‍රදේශයේ ව්‍යවසායකයන්ට පොදු පහසුකම් සැපයීමේ අරමුණෙන් ජල පිරිපහදු ඒකකය ස්ථාපනය කෙරිණි. නව ව්‍යාපාර ආරම්භ කිරීමෙන් පසු මෙම පිරිපහදු ඒකකයේ කටයුතු ඵලදායීව සිදුවනු ඇති බව. | අදාළ යන්ත්‍රය ප්‍රයෝජනයට ගනිමින් අරමුණුගත කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වේවැල් හා උණ ලී අංශය සතු රු.255,000 ක් වටිනා බැම්බු ස්ටීමර් යන්ත්‍රය 2024 ජුනි 03 දින වන විටත් මධ්‍යස්ථාන පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍රය උණ හා වේවැල් රත් කර අවශ්‍ය ආකාරයට හැඩ හා නිර්මාණ සකසා ගැනීමට භාවිතා කරන අතර අඛණ්ඩව භාවිතා නොකරයි. අවශ්‍යතාවය මත උණ හා වේවැල් පුහුණු මධ්‍යස්ථාන සඳහා ලබා දීමට කටයතු කර ඇති බව. | යන්ත්‍රය උපරිම වශයෙන් ඵලදායීව ප්‍රයෝජන ගැනීමට යෝග්‍ය ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඇ) | 2020 හා 2021 වර්ෂවලදී ප්‍රදර්ශන සඳහා මිලදී ගත් රු.621,395 ක් වටිනා නිමි භාණ්ඩ, මධ්‍යස්ථානයේ වැඩහලෙහි නිෂ්පාදනය කරන ලද රු.1,859,866 ක් වටිනා නිමි භාණ්ඩ අයිතම 736 ක් හා | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චලනය නොවන අමුද්‍රව්‍ය හා නිෂ්කාර්යය නිමි භාණ්ඩ තොග ඵලදායිව |

| | | |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වරින් වර මිලදී ගත් රු.905,686 ක් වටිනා චලනය නොවන අමුද්‍රව්‍ය හා නිමි තොග ද 2023 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි. | | ප්‍රයෝජනයට ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් ස්ථාපිත කළ යුතුය. |

## 3.5 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ශිල්පීන් ප්‍රවර්ධනය සඳහා ලද මුදලින් රු.2,312,228 ක් අරමුණු ඉටුකිරීමකින් තොරව මුල්‍ය ප්‍රකාශන වල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | කොරෝනා වසංගත තත්වය, ඉන්ධන අර්බුදය ආදිය හේතුවෙන් ඉටු කිරීමට නොහැකි වූ අතර, මෙම කාර්යය නැවත සම්පූර්ණ කිරීමට අදාල ගම්මානවල දැනට කර්මාන්තයේ නියුතු ශිල්පීන් හඳුනාගෙන කටයුතු කළ යුතුව ඇති බව. | ලැබී ඇති අරමුදල් උපයෝජනය කර අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගත යුතුය. |

## 3.6 ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ජාතික ආර්ථිකයට දායක කර ගැනීම සඳහා හස්ත කර්මාන්ත පුහුණුව ලබාදීමට රු.900,000 ක් වෙන්කර තිබූ අතර පුහුණුලාභීන් 40 කට ප්‍රතිලාභ ලබාදීමට වැඩසටහන් 2 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද වර්ෂය තුළ මෙම කාර්යයන් සැලසුම් කළ පරිදි ඉටුකර නොතිබුණි. | මෝස්තර අංශයේ මෝස්තර සංවර්ධන නිලධාරීන්ගේ ඌනතාවය හේතුවෙන් මෙම පුහුණුව ලබාදීමට නොහැකි වී ඇති බව. UNDP අරමුදලේ ප්‍රතිපාදන නිදහස් කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය නොලැබීම නිසා මෙම වැඩසටහන් පැවැත්වීමට නොහැකි වූ බව. | වැඩසටහන් සැලසුම් කිරීමේදී බලපෑ හැකි සියළු සාධක සැලකිල්ලට ගත යුතු අතර සැළසුම් ප්‍රකාරව කටයුතු ඉටුකරගත යුතුය. |
| (ආ) | ආයතනය විසින් ව්‍යාපෘති සැලැස්මක් සකස් කර සෘජු හා වක්‍ර ප්‍රතිලාභීන් 6700 කට ප්‍රතිලාභ ලබාදීම අරමුණු කරගෙන තිබුණද කෙතරම් ශිල්පීන් සංඛ්‍යාවක් ප්‍රතිලාභ ලබාගත්තේ ද යන්න හඳුනාගැනීමට විශ්ලේෂණයක් සිදුකර නොතිබීම නිසා ව්‍යාපෘති සැලැස්ම තුලින් අරමුණු ඉටු වී තිබේ ද යන්න නිරීක්ෂණය කල නොහැකි විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ පසුවිපරම් ක්‍රියාවලියක් සිදුකර තොරතුරු යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) ඡේදය ප්‍රකාරව සුදුසුකම්ලත්, උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදිය යුතු බව දක්වා තිබුණද බතික් විලාසිතා දැක්ම සඳහා ඇඳුම් නිර්මාණකරුවන් තෝරා ගැනීම හා ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයට අදාළ කාර්යයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් පරිබාහිරව සිදුකර තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3.(අ) ප්‍රකාරව සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීමට කටයුතු කර නොතිබුණි. | දුරකථන නාමාවලියෙහි කහ පැහැති පිටු සහ දේදුනු පැහැති පිටුවල ප්‍රසිද්ධ ආයතන මඟින් මිල කැඳවීම් සිදු කර ඇත. 2025 වර්ෂයේ සිට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීමට හා සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතුය. |